german
cooperation
DEUTSCHE ZUSAMMENARBEIT

giz Deutsche Gesellschaft für Internationale Zusammenarbeit (GIZ) GmbH

# විල්පත්තු ජාතික උද්‍යානය

## තොරතුරු මාර්ගෝපදේශය / පත්‍රිකාව



ප්‍රකාශයට පත් කළේ-
විල්පත්තු ජාතික උද්‍යානය සහ පාලන කලාප කළමනාකරණ ව්‍යාපෘතිය

GIZ දේශීය කාර්යාලය | ශ්‍රී ලංකාව
නො 6, ජාවත්ත ඇවනිව්,
කොළඹ 05

දු +94 112 599713-6
ෆැ + 94 112 551525

ඊ giz-srilanka@giz.de
වෙ www.giz.de/srilanka

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
අංක 811A, ජයන්තිපුර පාර,
බත්තරමුල්ල

දු + 94 11 2 888 585
ෆැ + 94 11 2 883 355

වෙ www.dwc.gov.lk

සහයෝගය - ෆෙඩරල් ආර්ථික සහයෝගිතා හා සංවර්ධන අමාත්‍යාංශය (BMZ)

ක්‍රියාත්මක කළේ - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
GIZ ශ්‍රී ලංකා සහ GOPA කන්සල්ටන්ට්ස් ආයතනය

කර්තෘ- GOPA/ ආචාර්ය නිශාන්ති පෙරේරා

සැලසුම- GIZ/ අසංග වර්ණකුලසූරිය

ඡායාරූප අයිතිය- GIZ/ ඩැනියෙල් ෂ්රයිබර්, අෂ්රොෆ් කාසිම්,
GOPA/ ආචාර්ය නිශාන්ති පෙරේරා, සොහාන් මුණවීර

ප්‍රකාශන අයිතිය © 2018 GIZ ශ්‍රී ලංකා සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

සියලුම හිමිකම් ඇවිරිණි. මෙම ලේඛනය හෝ අඩංගු කොටස් ලිඛිත අනුමැතියකින් තොරව ප්‍රතිනිෂ්පාදනය හෝ භාවිතා කිරීම තහනම් ය.



## විල්පත්තු ජාතික උද්‍යානය ගැන සැකෙවින්

- ප්‍රමාණය හෙක්ටයාර 131,655 යි
- 1938 සිට ම ජාතික උද්‍යානයකි
- 2013 සිට ම ජාත්‍යන්තර වැදගත්කමක් ඇති රැම්සාර් තෙත්බිමකි
- 40කට අධික විල්ලු පරිසර පද්ධති
- අලියා, දිවියා, සහ වලසා යන සතුන් බහුලව දැකගැනීමේ අවස්ථාව ඇති ප්‍රදේශයකි
- පුරාවිද්‍යාත්මක ස්ථාන සහ පුරාණ වාරිමාර්ග පද්ධති
- ප්‍රවේශ පත්‍ර කවුළු දෙකක්: හුනුවිලගම සහ එළුවන්කුලම
- රථ වාහන උපරිම වේගය- පැ.කි.මී. 25
- නැරඹිය හැකි කාල වේලාව පෙරවරු 6 - පස්වරු 6





විල්පත්තු ජාතික උද්‍යානය හෙක්ටයාර 131,656 ක භූමි ප්‍රදේශයක් ආවරණය වන අතර, එය ශ්‍රී ලංකාවේ විශාලතම ජාතික රක්ෂිතය වේ. 1938 දී වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ එය ජාතික උද්‍යානයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. එය 1938 සිට 1973 දක්වා ගැසට් කරන ලද කොටස් පහකින් සමන්විත වන අතර, එය පාලනය  කරනු ලබන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසිනි. මන්නා-රම සහ වවුනියා දිස්ත්‍රික්කවලට මායිම් වන මෙම උද්‍යානය පුත්තලම සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්ක පුරා විහිදේ. විල්පත්තු ජාතික උද්‍යානය උතුරින් මෝදරගම් අරු සහ අරවි ආරු ගංගාවලින් ද, දකුණින් කලා ඔයෙන් සහ බටහිරින් වයඹ දිග වෙරළ තීරයෙන් මායිම් වේ. බටහිර විල්පත්තු අභයභූමිය සහ හෙක්ටයාර 40,000 ක මාවිල්ලු වන රක්ෂිතයෙන් උතුරු මායිම ආවරණය කරන අතර, හෙක්ටයාර් 21,933ක් වූ තබ්බෝව අභයභූමිය එහි දකුණු මායිමට යාබදව පිහිටා ඇත. මෙම ප්‍රදේශය අලින් සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාසස්ථානයකි.

විල්පත්තු ජාතික උද්‍යාන භූ දර්ශනය තැනිතලාමය වන අතර වියළි සදාහරිත වනාන්තරයකින් සහ පතනශීලී කටු පඳුරු වලින් වැසී ඇත. මෙහි විවෘත තැනිතලා සහ විල්ලු නමින් හඳුන්වන වැලි කඳු හෝ වාලුකා තැනිතලා වලින් වටවූ සෘතුමය හෝ ස්ථිර විල් 40 ක් පමණ දක්නට ලැබේ. විල්ලු යනු තැනිතලාමය, වැසි ජලය අඩංගු නොගැඹුරු අවපාතයන් වන අතර සාමාන්‍යයෙන් ඒවාට ජලය ඇතුල්වීමක් හෝ පිටවීමක් නොමැත.



විල්පත්තු හෙවත් විල් වලින් පිරුණු පත්තුව/ප්‍රදේශය යන නම ඊට ලැබී ඇත්තේ එලෙස ය. විල්ලුවල ප්‍රමාණය හෙක්ටයාර 10 සිට 160 දක්වා පමණ වන අතර මිරිදිය (උදා- කුඹුක් විල), කිවුල් ජලය (උදා- කාලි විල්ලුව) හෝ ලවණ ජලය (උදා- කොක්කරි විල්ලු) අඩංගු විය හැකිය. ජාතික උද්‍යානයේ මධ්‍යම හා වයඹ දෙසින් පිහිටා ඇති මෙම විල්ලු විවිධ සතුන් හා ශාක වලට වාසස්ථාන සපයයි. 2013 දී විල්පත්තු ජාතික උද්‍යානය සහ එහි මායිම් වූ මුහුදු හා කිලෝමීටර් 10 ක් ඈතින් පිහිටි දූපත්, මහාවිලච්චිය වැව ද රැම්සාර් සම්මුතිය යටතේ ජාත්‍යන්තර වැදගත්කමක් ඇති තෙත් බිමක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

## භෞතික ලක්ෂණ

දේශගුණය ශ්‍රී ලංකාවේ වියළි හා අර්ධ ශුෂ්ක කලාපයට සමාන ය.
තෙත් (මෝසම්) සහ වියළි කාලයන් මාරුවෙන් මාරුවට දක්නට ලැබේ.

- උන්නතාංශය මුහුදු මට්ටමේ සිට මීටර් 240 දක්වා පරාසයක පවතී.
- වාර්ෂික වර්ෂාපතනය දළ වශයෙන් මි.මී. 1000 කි.
- වර්ෂාව ලැබෙන කාලः සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා, සහ මාර්තු සිට මැයි දක්වා.
- වියළි කාලයः ජනවාරි සිට පෙබරවාරි දක්වා, සහ මැයි සිට සැප්තැම්බර් දක්වා.

## ජෛව විවිධාත්මක වටිනාකම

විල්පත්තු ජාතික උද්‍යානයේ 70% ක් පමණ, පාංශු තත්ත්වය හා පතනශීලී කටු පඳුරුවල පිහිටීම මත පදනම්ව, විවිධ උසින් යුත් වියළි සදාහරිත වනාන්තරවලින් වැසී ඇත. තෙත් කාලවලදී ගංවතුරට නිරාවරණය වන, විල්ලු වටා පිහිටා ඇති කුඩා තෘණ බිම්ද ඇත. විල්පත්තු හි ශාක විශේෂ 621 ක් වාර්තා වී ඇති අතර, විශාල පළු ගස (*Manilkara hexandra*) වනාන්තරයේ කැපී පෙනේ. ස්ථිර හා සෘතුමය ගංගා මෙන්ම වසර 2,000 ක් පමණ පැරණි වැව්, වෙරළබඩ කරදිය වගුරුබිම් සහ ලඳු කැලෑ වෙරළාසන්නව පිහිටා ඇත. කලා ඔය මෝය ශ්‍රී ලංකාවේ විශාලතම කඩොලාන වනාන්තරවලින් එකකි. ඉතා සාරවත් නොගැඹුරු මුහුද කුඩා පරිමාණ සාම්ප්‍රදායික ධීවරයින්ගේ ජීවනාලිය වන අතර, එහි ඇති මුහුදු තණකොළ, ගෝලීය වශයෙන් වඳවීමේ තර්ජනයට ලක්ව ඇති මුහුදු ඌරා නම් සමුද්‍රීය ක්ෂීරපායීන් විශේෂයට ආහාර සපයයි.

විල්පත්තු ජාතික උද්‍යානය සහ ඒ අවට ප්‍රදේශය බොහෝ විශේෂයන්ට අයත් සතුන්ට වාසස්ථාන සපයයි :

- මිරිදිය මත්ස්‍ය විශේෂ 23 ක්
- උභයජීවී විශේෂ 17 ක්
- උරග විශේෂ 57 ක්
- කුරුල්ලන් විශේෂ 253 ක්
- ක්ෂීරපායී විශේෂ 45 ක්







කොටියා (*Panthera pardus kotiya*) වලසා (*Melursus ursinus*) සහ අලියා (*Elephas maximus maximus*) යන ගෝලීය වශයෙන් තර්ජනයට ලක් වූ විශාල ක්ෂීරපායින් බහුලව ඇති ප්‍රදේශයක් ලෙස මෙම උද්‍යානය ප්‍රසිද්ධ ය. තිත් මුව (*Axis axis*) රංචු උද්‍යානය පුරාවට දැකිය හැකි අතර, ගැට කිඹුලා (*Crcodylus palustris*) ද උද්‍යානයේ බහුල සුවිශේෂී උරගයෙකි. යාබද නොගැඹුරු සාගර ජලයේ වඳවීමේ තර්ජනයට ලක්ව ඇති මුහුදු ඌරා (*Dugong dugon*), ඉන්දු-පැසිෆික් හම්ප්බැක් ඩොල්ෆින් මසුන් (*Sousa chinensis*) සහ සමුද්‍ර කැස්බෑවන් (ඔලිව් රිඩ්ලි - *Lepidochelys olivaceae* සහ හරිත කැස්බෑවා - *Chelonia mydas*) ජීවත් වේ.

මෙම දැක්වෙන ආවේණික පක්ෂි විශේෂ විල්පත්තු ජාතික උද්‍යානයේ සහ අවටින් වාර්තා විය( ශ්‍රී ලංකා වළි කුකුළා (*Gallus lafayetti*), ශ්‍රී ලංකා බටගොයා (*Treron pompadora*) අළු කෑදැත්තා (*Ocyceros gingalensis*) හිස කළු කොණ්ඩයා (*Pycnonotus melanicterus*), ශ්‍රී ලංකා බොරග දෙමලිච්චා (*Pellorneum fuscocappilum*), ශ්‍රී ලංකා ගිරාමලිත්තා (*Loriculus beryllinus*), හීන් කොට්ටෝරුවා (*Megalaima rubricapillus*), රත්පිට මහ-කෑරලා (*Chrysocolaptes stricklandi*), ශ්‍රී ලංකා වැහිලිහිණියා (*Hirundo hyperythra*), සහ ශ්‍රී ලංකා වන-සැරටිත්තා (*Tephrodornis affinis*).



## ඓතිහාසික හා සංස්කෘතික වටිනාකම

වැව්, බෞද්ධ ආරාම, ස්ථූප සහ පාෂාණ සෙල්ලිපි ඇතුළු උද්‍යානය පුරා විසිරී ඇති ව්‍යුහයන් මෙම ප්‍රදේශයේ පැවති වාරිමාර්ග කෘෂිකර්මාන්තය මත පදනම් වූ ශිෂ්ටාචාරයක් පිළිබඳ සාක්ෂි සපයයි. පුරාවෘත්ත හා ඓතිහාසික සිද්ධීන් බොහෝමයක් උද්‍යානය හා ඒ අවට පරිසරය හා සම්බන්ධ වේ. ක්‍රි.පූ 500 දී පමණ සිංහල ජනයා පැවත එන බව කියනු ලබන, විජය රජු, ගොඩබැසියා වූ, තම්මැන්නා නුවර විල්පත්තු ජාතික උද්‍යානයේ කුදිරමලේ තුඩුව සහ මොදරගම් ආරු මුඛය අතර පිහිටි බව කියනු ලැබේ. මීට වසර 2,000 කට පෙර දුටුගැමුණු රජුගේ පුත් සාලිය කුමරු සිය මනාලිය වූ අශෝකමාලා සමඟ වාසය කළ ස්ථානය මරදන්මඩු වැවේ ඊසාන දෙසින් පිහිටි ගල්බැඳි නීරාවිය විය යුතුය. තවද, පේලියෝලිතික හා මෙසෝලිතික යුගයේ ප්‍රාග් ඓතිහාසික ස්ථාන ද වාර්තා වී ඇත.

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය අතරතුර වසර 20 කට ආසන්න කාලයක් මෙම උද්‍යානය මහජනතාව සඳහා ප්‍රවේශය අවහිර කර තිබූ නමුත් 2009 මැයි මස යුද්ධය අවසන් වීමෙන් පසු 2010 පෙබරවාරි 27 වන දින නැවත විවෘත කරන ලදී. සැලකිය යුතු කාලයක් දක්වා, යුද්ධයේ ඉදිරි මායිම් වශයෙන් උද්‍යානය හෝ ඒ අසල පෙදෙස් භාවිතා කර තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස උද්‍යාන කළමනාකරණය දැඩි ලෙස අඩපණ වූ අතර කාර්යමණ්ඩලය සහ වනජීවීහු ද බොහෝ කරදරවලට මුහුණ පෑහ. දැන් උද්‍යානයේ යටිතල පහසුකම් හා කළමනාකරණ කටයුතු පුනරුත්ථාපනය කර, ශක්තිමත් කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වන ජීවීන් ද යථා තත්ත්වයට පත්වෙමින් සිටිති.

විල්පත්තුවේ මායිම් ගම්මාන 135 ක, පුද්ගලයන් 34,000 ක් පමණ වෙසෙයි. ඔවුන්ගේ ජීවනෝපායන් අතර කරදිය ධීවර කර්මාන්තය, උතුරු සහ දකුණු කොටස්වල ගවයන් ඇති කිරීම යනාදිය පවතින නමුත් ඔවුහු බොහෝ විට බෝග වගාවේ නියැලෙති. ජාතික උද්‍යානයක් අසල ජීවත් වීම නිසා සතුන් බෝග අනුභව කිරීම වැනි අභියෝග රාශියක් ඔවුන්ට ඇතිවේ. නමුත් මෙම ප්‍රදේශය ආශ්‍රිතව සංචාරක ක්ෂේත්‍රයේ රැකියාද පවතී. විල්පත්තු ප්‍රජා සත්කාරක වැඩසටහනක් ඇති අතර එමඟින් එවැනි ගැටළු අවම කිරීම සහ ප්‍රාදේශීය ජනතාව සමඟ සමීපව කටයුතු කිරීමෙන් ප්‍රතිලාභ වැඩි කිරීම බලාපො-රොත්තු වේ.



## සංචාරක තොරතුරු

සංචාරය සඳහා උද්‍යානයට ඇතුළුවීමට හුණුවිලගම (අනුරාධපුරය) හෝ එළුවන්කුලම (පුත්තලම) උද්‍යාන පිවිසුම් දෙකෙන් එකකින් නියමිත ගෙවීමක් කිරීමෙන් අවසර පත්‍රයක් ලබා ගත යුතු වේ. උද්‍යානය දිනපතා උදේ 6 සිට සවස 6 දක්වා විවෘතව පවතින නමුත් අයහපත් කාලගුණික තත්ත්වයන් මත ආරම්භක වේලාවන් වෙනස් විය හැක. උද්‍යානය තුළ ගමන් කිරීමට ෆෝ වීල් රථ වාහනවලට පමණක් අවසර දී ඇති අතර එම ජීප් රථවල උපරිම වේග සීමාව පැයට කිලෝමීටර 25 කි. නරඹන්නන්ට තම වාහනවලින් පිටතට ඒමට අවසර ඇත්තේ කුඹුක් විල සහ කුදිරමල තුඩුව වැනි නිශ්චිත ස්ථානයන්වල පමණි. හුණුවිලගම පිවිසුමේ කෞතුකාගාරයක් පිහිටුවා ඇත.

ජාතික උද්‍යානය සතුව පුද්ගලයන් 10 දෙනෙකු පමණ ලැගුම් ගත හැකි ක්ෂේත්‍ර බංගලා හතක්, සහ පුද්ගලයින් 50 දෙනෙකුට පමණ ලැගුම් ගත හැකි වන නිවහනක් ඇත. වඩාත් ස්වාධීන හා වික්‍රමාන්විත අත්දැකීමකට ප්‍රිය කරන අය සඳහා කඳවුරුබිම් ද ඇත. දෛනික සංචාරයන් මෙන්ම බංගලා, නේවාසිකාගාරය, සහ කඳවුරු භූමිය ඊ-සේවාව හරහා හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා සෘජුව වෙන් කරවා ගත යුතු ය.

උද්‍යාන පිවිසුම් දෙකේ සිට කිලෝමීටර 10ක් ඇතුළත විවිධ මට්ටමේ නවාතැන්පොළ ඔබට දැකගත හැකිවනු ඇත. තවත් ලැගුම්හල් උද්‍යානයේ සිට කි.මී. 25-30ක් දුරින් පිහිටි අනුරාධපුරයේ හෝ කල්පිටියේ පවතී.



## විල්පත්තු ජාතික වනෝද්‍යාන සංචාරකයින් සඳහා චර්යාධර්ම පද්ධතිය

- වනෝද්‍යානයේ වන සතුන්ට ආහාර ලබා දීම හෝ කිසිදු වස්තුවක් හෝ ද්‍රව්‍යයක් ළඟ තබාගැනීමට හෝ සිහිවටනයක් ලෙස ලබාගැනීමට හෝ උද්‍යානයෙන් පිටතට ගෙන යාමට අවසර නැත. (මෙයට සතුන්, කෘමීන්, ශාක, මල්, බිත්තර, අස්ථි, හිස් කබල්, පාෂාණ ආදිය ද ඇතුළත් වේ.)
- සතුන් පීඩාවට පත් නොවන ලෙස දැඩි නිශ්ශබ්දතාවයකින් යුතුව නිරීක්ෂණය කරන්න.
- ඔබේ වාහනයෙන් පිටතට නොඑන්න. සංචාරයේ යෙදෙන විට ජනේලයෙන් පිටතට එබීමෙන් හෝ වහලය මතට නැගීමෙන් වළකින්න.
- ඔබේ වාහනයෙන් පිටවීමට අවසර දී ඇත්තේ කුඹුක් විල සහ කුදිරමලේ වැනි නිශ්චිත ස්ථානයන්වල දී පමණි.
- ඔබේ වාහනයෙන් ඉවතට කුණු හෝ කිසිම ආගන්තුක ද්‍රව්‍යයක් විසි කිරීම සපුරා තහනම්ය. කරුණාකර සියලු කසළ ඔබ සමඟ රැගෙන ගොස් වගකීමෙන් යුතුව බැහැර කරන්න.
- උද්‍යානය තුළ දුම් පානය කිරීම සපුරා තහනම් ය.
- උද්‍යානය තුළ අවසර ලත් ෆෝ වීල් රථවාහන පමණක් ධාවනය කළ හැකි අතර, ඒවායේ උපරිම වේග සීමාව පැයට කිලෝමීටර 25 කි.
- මන්දගාමීව රිය පැදවීම මඟින් කුරුල්ලන්, උරගයින්, උභයජීවීන්, සහ කෘමීන් වැනි කුඩා සතුන් පහසුවෙන් නිරීක්ෂණය කළ හැකිවනු ඇත.
- කරුණාකර ඔබේ රියදුරා වෙනත් වාහනවලට බාධා නොකරන බවටත්, වනජීවීන්ගේ හැසිරීමට බාධා නොකරන බවටත් සහතික වන්න.



## සිතියම



